ඔහු පාසල් යන වියේදීමය. එවක මරදානේ පදිංචිව සිටි ලන්ත්‍රාගේ දෙමාපියෝ ඔහු ඇතුළත් කරන ලද්දේ මරදාන සතිරා විද්‍යාලයටය. කුඩා අවධියේ සිටම ගී ගැයීමට කැමැත්තක් සහ දක්ෂතාවක් දැක්වූ හරෑන් පන්ති කාමරයේ ඉඳ හිට ලැබෙන විරාමයක් ගෙවා දැමුවේ මිතුරන් සමග එක්ව හීනි සංගීත සාජ්ජයකිනි.

දිනක් මෙලෙස සාජ්ජයක් පැවැත්වෙන අතර පන්ති කාමරය අසලින් ගිය විදුහල්පතිවරයාට ලන්ත්‍රා සමාගමේ මේ විනය විරෝධී ක්‍රියාව අතටම අසුවිය. එහි මූලිකයා ලෙස විදුහල්පතිවරයාගේ ඇස ගැසුනේ ලන්ත්‍රාය. විදුහල්පතිවරයා ඔහුට අපූරු දඬුවමක් දුන්නේය. ඒ විදුහලේ සංගීත විෂයභාර ආචාර්යවරයා වෙත ලන්ත්‍රා යොමුකර ඔහුගේ විෂය නිර්දේශයට විෂයක් වශයෙන් සංගීතය ඇතුළත් කරලීමෙනි. ප්‍රතිඵලය හිතුවාක් මෙන්ම විය. ලන්ත්‍රා සංගීතය විෂයට විශිෂ්ඨ සාමාර්ථයක් සමගින් විභාගය සමත්ව ගේලුඩ් සංගීත පීඨයට ඇතුළත්වීමට ද වරම් ලැබුවේය.

'ඊට පස්සේ මෙයා වෙන රස්සාවල් හොයලාම නෑ. සින්දු කියන එකම තමයි කරලා තියෙන්නේ.' අතාරිත් පවසන්නේ ඒ පිළිබඳ ඇති සතුටකින්ද නොඑසේව නෝක්කාඩුවකින්ද යන්න අපැහැදිලිය.

කෙසේ වුවද ගායනය සිය වෘත්තිය සේ තෝරාගත්තද එවැනි වෘත්තියකින් සිය ජීවිතය ගොඩනගා ගන්නා ආකාරය පිළිබඳ තිසි තක්සේරුවක් ලන්ත්‍රාට නොතිබූ බව ඔහුගේ වර්ථමාන ජීවිතය කියාපායි. ඔහු ජනප්‍රියත්වයේ හිණි පෙත්තේ ඉන්නා සමයේ හෝ ඔහුට කියා තිවෙසක් තබා අඳුතරමින් වාහනයක්වත් තිබී නොමැත. අතාරිත් පවසන්නේ සිය සැමියා කිසිදු දිනෙක මුදල් පසුපස එල්ලී නොගිය බවත් කවරාකාර වෘත්තීය කටයුත්තකදී වුවත් ව්‍යවසායකයා විසින් අත මිට මොළවන කියක් හෝ රැගෙන නිහඬව නිවෙසට පැමිණීම ඔහුගේ පුරුද්ද වූ බවත්ය. එහි ප්‍රතිඵලය බොහෝ දෙනෙකු විසින් මේ හිත හොඳ කත ගර්හණීත්වයට පත්කිරීමය. සටකපටීන් විසින් මේ අවස්ථාව කෙතරම් හොඳින් තම අවශ්‍යතා සාධනය වෙනුවෙන් යොදාගෙන ඇත්ද යත් මීට වසර කීපයකට පෙර ලන්ත්‍රාගේ සී.ඩී. තැටියක් නිෂ්පාදනය කළ පුද්ගලයකු ගණුදෙනු බේරීම සඳහා ඔහුගේ නිවෙසට පැමිණ රුපියල් දෙදහසක් ඔහු අතමිට මොලවා 'බයි බායි' කියා පිටත්ව ගොස් ඇත.

'මෙයා කවදාවත් සල්ලි පස්සේ පන්නන්නේ නෑ. දෙන්නේ කියද අරගෙන නිකන් ඉන්නවා. සමහරු කියක්වත් දෙන්නෙ නැතිවෙලාවලුත් තියනවා. බොන්ඩ අරන්දීලා නිකන් ඉන්නවා. බැන්දට පස්සේ මමත් මෙයත් එක්ක හැම තැනකම පස්සෙන් යන්ඩ පුරුදු වුණා සල්ලි ටික හරියට ගන්ඩ.'
අතාරිත් ලන්ත්‍රාගේ ජීවිතයේ තවත් පැත්තක් හෙළිදරව්ව කරන්නට පටන් ගනිද්දී ඇයගේ හැට්ටය තුළ සඟවාගෙන සිටි යමකින් මුදල් නෝට්ටුවක් උදුරාගත් ලන්ත්‍රා සුළු වේලාවක් එකල මෙකල වෙමින් සිට හීන් සීරුවේ නිවෙසින් එළියට බැස්සේය. ඒ ඇසිල්ලේ අතාරිත් තවත් අපූරු රහසක් ගෙනහැර පෑවාය.

'එයා මේවා කියනවට වැඩිය කැමති නෑ. තරුණ කාලේ ඉඳලම මෙයා වැඩිය කතා කරන්නේ නෑ. හරියට බොරුකාරයන්ට අනුවෙනවා. නුවර පැත්තේ කට්ටියක් මෙයාව රවට්ටලා මනමාලියෙක් බලන්න එක්ක ගිහිල්ලා තියනවා. ටයි කෝට් අන්දලා එක්ක ගිහිල්ලා ගෑනු ළමයව පෙන්නලා. මෙයා කැමතිවෙලා. එහෙමනම් පමා නොකර කසාදෙ කරමු කියලා මගුල් ගෙදර අරගෙන. බලනකොට මනමාලිට ඉන්නේ අර බලන්න ගියපු ළමය නෙවෙයිලු. ඇඳුවම ඒ අම්මයි තාත්තයි කිව්වලු එදා පෙන්නුවේ නංගි. අක්කව ගෙදර තියාගන නංගිව දෙන්න බැරි නිසා නංගිට පස්සේ කසාදයක් කරනකම් අක්කව දෙන්න තීරණය කළා කියලා. මෙයා සද්ද නැතුව ඉඳළා. බැන්දට පස්සේ බලනකොට මනාමාලිට ළමයෙක් හම්බවෙන්න ඉන්නවලු. ඒත් ඉතිං වෙච්ච දේනේ කියලා මෙයා කටවහගෙන ඉඳලා. ඒ දවස්වල මෙයා නිතර සංගීත ප්‍රසංගවලට රෑට ගෙදරින් පිට යන කාලේ. එහෙම ගිහින් කලින් ආව දවසක මෙයා දොරට ගහද්දී ගෑනු කෙනා ඇවිත් දොර අරිනකොට මිනිහෙක් ගේ ඇතුළේ ඉඳළා අතටම අනුවෙලා. එදා තමයි මෙයා කසාදෙ ඉවරයි කියලා ගෙදරින් එළියට බැහැලා ඇවිල්ලා තියෙන්නේ.'

අතාරිත් ගේ මේ හෙළිදරව්ව අවසන්වන මොහොතේම ලන්ත්‍රා සිගරට්ටුවක් මුවේ රුවාගෙන දුම් වළලු පිටකරමින් යළි නිවෙසට පැමිණියේය.

එතැන් සිට කතාවට විෂය වූයේ අතාරිත් - හරෑන් ප්‍රේම පුරාණයයි. ඔහුට අතාරිත් හමුවන්නේ නුවර විවාහය අවසන් කර කෙටි කලකට පසුවය. අතාරිත් මහරගම පදිංචිව සිටි පොලිස් පරීක්ෂකවරයකුගේ දියණියක වූවාය. අතාරිත් දැකීමෙන් පසු ලන්ත්‍රා ඈ පිළිබඳ උනන්දුවක් දක්වන්නට පටන්ගත්තද ඇයගේ නිවෙසින් එවැනි සම්බන්ධතාවයකට විරෝධය පළවී ඇත්තේ ලන්ත්‍රාට ස්ථිර රැකියාවක් නොමැතිකම හේතුවෙනි. ඔහු වරක් විවාහ වූවෙකු බව දැනගැනීමෙන් පසු ඒ විරෝධය තවත් වැඩිවී ඇත.

'ඒ වුණාට ඉතිං මට හිතුණා මෙයාගේ දුර්වලකම් හදාගන්න පුළුවන්වෙයි කියලා. ඒ නිසා මම කැමති වුණා'

එලෙස ඇරඹෙන හරෑන්-අතාරිත් යුග දිවිය සෙමින්, එහෙත් ජීවිත කාලයක් පුරාවට ගලා බසින ගංගාවක් බවට පත්ව ඇත. එහි එකම අඩුපාඩුව ඔවුන්ට තමන්ගේ කියා දරුවන් නොමැතිකමය. එහෙත් දෙදෙනාගෙන් එක් අයෙක්වත් ඒ පිළිබඳ පශ්චාත්තාපයකින් පසු නොවෙති. ඒ වෙනුවට ඔවුන් තුළ ඇත්තේ ආපදාවකින් ගැලවීගත්තාක් බඳු සොම්නස් හැඟීමකි.

'අපේ අයිය කෙනෙක් ළමයෙක් අරගෙන හදාගත්තා. ලොකු වුණාම එයා හදාගත්ත ළමයෙක් කියලා දැනගෙන සුයිසයිඩ් කරගන්නත් ගියා. ඒ අයට ඒක ලොකු ප්‍රශ්ණයක් වුණා. ඒ නිසා අපි අනුන්ගේ ළමයෙක් අරගෙන හදාගන්න කැමතිවුණේ නෑ'

හරෑන් ලන්ත්‍රා ගායනයට පමණක් නොව වාදනයටද දක්ෂතා ඇත්තෙකි. ඔහු පවසන අයුරු සංගීත භාණ්ඩ කීපයක් වාදනය කිරීමේ හැකියාව ඔහු සතුය. ඒ අතරින් වැඩිපුරම දක්ෂ තබිලා වාදනයට බව හේ පවසයි. එහෙත් මේ වන විට ගායනයෙන් මෙන්ම වාදනයෙන්ද දුරස්ථ සිටින ලන්ත්‍රාගේ නිවෙසේ කිසි සංගීත භාණ්ඩයක් හෝ දැකගන්නට නොවීය.

'සංගීත පන්තියක් වගේ කරන්න පුළුවන්නේ ?'

ඔවුන්ට පවතින ආර්ථික දුෂ්කරතාවලින් මිදීමේ මාවතක් සේ මට පෙනුනු කාරණය ගැන මම විමසා සිටියෙමි.

'දැනටත් සමහර අය අහනවා ළමයින්ව එවන්න. ඒ වුණාට දැන් ඉතිං ඕවා කරන්න පුළුවන්කමක් නෑ' ඒ අතාරිත්ය.

එදා-මෙදා තුර ශ්‍රාවක ප්‍රතිචාර සම්බන්ධයෙන් විමසූ විට අතාරිත් පැවසුවේ එහි වෙනසක් නොමැති බවය. පසුගිය දිනෙක කොළඹ ගිය අවස්ථාවක මහ මගදී කුඩා ළමයෙකු පැමිණ අතින් අල්ලාගෙන අංකල් නේද අර සින්දු කියන්නේ යැයි කියමින් තොරතුරු විමසූ බවද ඔ පැවසුවාය.

ලන්ත්‍රා වෙනුවෙන් සිය ජීවිතයම කැප කළ ඔහුගේ බිරිය අතාරිත් ද මේ වන විට පසුවන්නේ අක්ෂි ආබාධයකින් පීඩා විඳිමිනි. ඇය යමෙකු හඳුනාගන්නේ දෑසින් නොව සවනින්ය. ඇයගේ අක්ෂි ආබාධය සුවකිරීමට රුපියල් 60 000/-ක මුදලක් වැය වන බව ඇය පරීක්ෂා කළ පෞද්ගලික රෝහලේ වෛද්‍යවරු පවසා තිබේ. එහෙත් ටවර් හෝල් පදනමෙන් මාසිකව ලැබෙන රුපියල් දෙදහසක ආධාර මුදලින් යැපෙන මේ යුවලට එවැනි මුදලක් එක්රැසේ කරගැනීම සිහිනයක්ව තිබේ.

ලන්ත්‍රා යුවලගේ දුක සැප විමසා බැලීමට, ඔවුන්ට උපකාරයක් කිරීමට රිසි පාඨක ඔබ වෙනුවෙන් ඔවුන්ගේ නිවෙසේ දුරකථන අංකය සටහන් කර තබමින් මේ සටහන අවසන් කරන්නට මම කැමැත්තෙමි. (011) 4927000 එම අංකයයි. ..

ශ්‍රීලාල් සෙනෙවිරත්න
(Srilal333@gmail.com)

YSL
Migration Services

ශ්‍රී ලාංකික ඔබට
සොඳුරු සේවය

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Lead Design House

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956
0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805

Now also available for consultation at
Bundoora
(Close to Latrobe university , RMIT and NMIT)
6 Mat Rush Avenue, Bundoora, VIC 3083
Tel: 03 9467 4468
yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED REGISTRATION NUMBER 0746956 mara.com.au
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA